**අකුරණ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 20 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ ගොඩනැගිලි සංවර්ධනයට අවස්ථා 3 කදී දරා තිබූ රු.2,453,382 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අයිතම 03 ප්‍රාග්ධනිත වී නොතිබුණු බව දන්වමි. |
| (ii) | සභාව සතු එගොඩකුඹුර ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී විධිමත් පරිදි පවරාගෙන ගිණුම්ගත කරන බව දන්වමි. |
| (iii) | ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු කායවර්ධන උපකරණ 9 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 9 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයන් 4 කට නඩු පවරා තිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ගිණුම්වල හෙළිදරව් කළ යුතු වේ. | ප්‍රමාද දෝෂයකින් ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව දන්වමි. |

(ඇ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 1 කට වැඩි එකතුව රු.4,399,126 ක් වූ ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ණයහිමි වටිනාකමින් රු.5,952,845 ක් ගෙවා ඇත. ඉතිරි ණයහිමි වටිනාකම සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | |
| (i) 52 වගන්තිය | අනවසර ඉදිකිරීම් 57 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අනවසර ඉදිකිරීම් සඳහා නඩු පැවරීමට කටයුතු කරමින් පවතී. |
| (ii) 126 vii (ඊ) වගන්තිය | දැන්වීම් පුවරු 55 කින් රු.105,200 ක ගාස්තු අයකර නොතිබුණි. | දැන්වීම් පුවරු සමීක්ෂණය කර ආදායම් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී මුදල් අයකර විගණනයට වාර්තා කරමි. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2)(ආ) ඡේදය | වසර 2 ක් ඉක්මවූ රු.551,465 ක වටිනාකම වූ තැන්පතු 18 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම තැන්පතු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන බව සඳහන් කරමි. |
| (ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| (i) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන චක්‍රලේඛයේ 10 වන වගන්තිය | බදුකරුවන් විසින් කඩ කාමර අතුරු බදු හා අතුරු කුලියට ලබාදුන් අවස්ථා විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | විධිමත් පරීක්ෂණයක් සිදුකර විගණනයට වාර්තා කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) 2013 ජූලි 31 දිනැති අංක 07 දරන චක්‍රලේඛය | 2019 වර්ෂය වන විට ප්‍රාදේශීය සභාව විසින් ත්‍රීරෝද රථ නැවතුම්පල 30 ක් පවත්වාගෙන ගොස් ත්‍රීරෝද රථ 582 ක් ලියාපදිංචි කර තිබුණ ද, ක්‍රමවත්ව වාර්ෂික ගාස්තු අයකර නොතිබුණි. | ත්‍රීරෝද රථ සමීක්ෂණය කර ගාස්තු අය කළ යුතු වේ. | විධිමත් සමීක්ෂණයක් කර ගාස්තු අයකරන බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,384,678 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,044,348 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,503,526 | 6,958,206 | 5,685,210 | 1,808,916 | 5,987,300 | 6,072,632 | 5,001,338 | 1,071,292 |
| (ii) | කුලී | 2,727,400 | 3,895,639 | 3,704,985 | 364,861 | 1,255,800 | 3,322,006 | 3,180,701 | 141,305 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,555,000 | 3,470,200 | 3,470,200 | - | 2,500,000 | 3,016,850 | 3,016,850 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,700,000 | 17,306,192 | - | 25,181,523 | 12,700,000 | - | - | 12,700,000 |
| | | 25,485,926 | 31,630,237 | 12,860,395 | 27,355,300 | 22,443,100 | 12,411,488 | 11,198,889 | 13,912,597 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.300,000 ක් හා මුද්දර ගාස්තු රු.15,756,931 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය වෙමින් පවතින බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------------**

**3.1 කාර්යසාධනය**

**------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයාගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබා නොගැනීම

---------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කර්තව්‍යයන් 04 ක් ඉටු නොකර රු.1,736,395 ක මුදලක් වියදමට හර කර ණයහිමි බැර කර තිබුණි. | සැලසුම්ගත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩිනමින් නිම කිරීමට සැලසුම් සකස් කර ඇත. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී කර්තව්‍යන් 17 ක් සඳහා රු.1,205,000 ක මුදලක් අයවැය මඟින් වෙන්කර ඇතත් එකී කර්තව්‍යන් අත්හැර දමා තිබුණි. | අයවැයගත යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රමුඛතාවය ලබාදිය යුතු යෝජනාවන්ට ප්‍රමුඛතාවය ලබාදීම තුළ මෙම කර්තව්‍ය අත්හැරී ඇති බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, එම නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 අයවැය ලේඛනය සකස් කිරීමේදී තිරසාර සංවර්ධන අරමුණු අදාළ කර ගනිමින් අයවැය සකස්කර ඇති බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අකුරණ වෙළඳ සංකීර්ණයේ නිර්මාණ සැලැස්මේ ඇති දුර්වලතාවයක් නිසා කඩ කාමර 25 ක් ව්‍යාපාර කටයුතු නොකර සභාව වෙත කුලී මුදල් ගෙවමින් තිබුණි. | වෙළඳුන්ට හා පාරිභෝගිකයින්ට ව්‍යාපාර කටයුතු කිරීමට පහසුකම් සැලසීමට කටයුතු කළ යුතු වේ. | රුපියල් ලක්ෂ 20 ක මුදලක් යොදවා වෙළඳ සංකීර්ණය නවීකරණය කර ඇති බව දන්වමි. |
| (ආ) | වරිපනම් බදු වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවද අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2012 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | කාලීනව වරිපනම් බදු තක්සේරු කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ තක්සේරු නිලධාරීන් පැමිණෙන බව දන්වා ඇතත් මේ දක්වා නොපැමිණි බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී සේවක අතිරික්තතා 2 ක් හා සේවක පුරප්පාඩු 18 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අතිරික්තතා අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ආ) | සභාවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.39,875 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම. | මියගොස් ඇති නිලධාරියකුගේ ණය ශේෂයක් බවත් එය කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇති බව දන්වා ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**-------------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ----------------------------- |
| (අ) | රු.17,649,179 ක් වටිනා මෝටර් ග්‍රේඩරය 2019 වර්ෂයේදී ධාවනය කර ඇත්තේ කි.මී.16 ක් පමණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉල්ලීම් නොතිබීම හේතුවෙන් මෙම තත්ත්වය උදා වී ඇත. |
| (ආ) | රු.2,000,000 ක වටිනාකමකින් යුත් එක්ස්කැවේටර් යන්ත්‍රය ප්‍රයෝජනයකට නොගැනීම නිසා දිරාපත් වෙමින් පැවතුණි. | වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගතයුතු වේ. | මෙම යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා තොරතුරු ලබාදෙන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ඇ) | බැකෝ යන්ත්‍රය සඳහා 2019 වර්ෂයේදී රු.185,327 ක වියදම් දරා ඇතත්, ධාවනය කර ඇත්තේ ධාවන පැය 98.3 කි. | යන්ත්‍ර උපයෝජනය කළ යුතු වේ. | දැනට මෙම යන්ත්‍රය අක්‍රීයව පවතින අතර යාන්ත්‍රික ඉංජිනේරුගෙන් උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. |
| (ඈ) | සභාවට අයත් ට්‍රැක්ටර් 2 ක් හා ට්‍රේලර් 3 ක් අලවතුගොඩ ක්‍රීඩා පිටියේ දිරාපත්වෙමින් පැවතුණි. | නිෂ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහන වෙන්දේසි කිරීමට කමිටුවක් පත්කර ඇත. වාර්තා ලබාදී නොමැති බව දන්වමි. |
| (ඉ) | රු.96,648 ක වියදමක් දරා ඉදිකළ වගා කුටියක් නිෂ්කාර්යව පැවතුණි. | මෙම කුටිය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | කොන්ක්‍රීට් තට්ටුව තුළින් ජලය කාන්දුවීම හා අතුරු ගැටළු රැසක් මතුවිය. ඵලදායී කටයුත්තකට මෙම කුටිය යොදා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | 2018 පෙබරවාරි 23 දින ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබී තිබූ කාය වර්ධන උපකරණ 9 ක් නිෂ්කාර්යව පැවතුණි. | මෙම උපකරණ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | කායවර්ධන මධ්‍යස්ථානයට මෙම උපකරණ යොදා ගැනීමට කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**----------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | ------------- | ----------------------------- |
| 2019 වර්ෂයේදී රු.10,392,887 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදන සිදුකර තිබුණ ද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම. | පිළිගනිමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-------------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් ආකාරයේ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |